# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1834/24 - 2013 ඔක්තෝබර් මස 30 වැනි බදාදා - 2013.10.30

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1980 අංක 2 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

1980 අංක 02 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනතේ, 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, ජනාධිපති, මහින්ද රාජපක්ෂ වන මම, මෙහි පහත සඳහන් උපලේඛනයේ විස්තර කොට ඇති ඉඩම් කොටස "කෑගල්ල නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ බස් ඩිපෝව ප්‍රතිස්ථාපනය සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා ගැනීමට" වහා අවශ්‍යව ඇති බව මාගේ මතය වන හෙයින්, එකී ඉඩම අදාළ කාර්යය සඳහා අවශ්‍ය බව මෙම නියමයෙන් ප්‍රකාශයට පත් කරමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2013 ඔක්තෝබර් මස 22 වැනි දින,
කොළඹ,
ජනාධිපති කාර්යාලයේ දී ය.

### උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාවත පත්තුව, පරනකුරු කෝරළේ, පරගම්මන ගමේ පිහිටියාවූ ද, බලයලත් මිනින්දෝරු හා තලමිතිකරු එස්. ඩබ්. වෛද්‍යරත්න මහතා විසින් මැන පිළියෙල කරන ලද අංක 15/2001 හා 2001.08.04 දිනැති සැලසුමේ කැබලි අංක 1 සිට 5 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 2.290ක් (අක්. 5, රූඩ්. 2, පර්. 25.40) විශාල වූ අටලාහේ කුඹුර, පහළවෙලගොඩදෙනිය කුඹුර, මල්ගහමුල කුඹුර හා ගල්ලෙනලඟ කුඹුර නමැති ඉඩම් වල මායිම් පහත පරිදි වේ.

**කැබලි අංක 1 - විශාලත්වයෙන් හෙක්ටයාර් 0.430 (අක්කර 1, රූඩ් 0, පර්. 9.96)ක් වූ අටලාහේ කුඹුර නමැති ඉඩම.**

උතුරට : ඇළ ;
නැගෙනහිරට : හෙට්ටිමුල්ල සිට කෑගල්ලට ප්‍රධාන පාර ;
දකුණට : ඇළ ;
බටහිරට : සැලැස්මේ කැබලි අංක 2.



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**කැබලි අංක 2 - විශාලත්වයෙන් හෙක්ටයාර් 0.298 (අක්කර 0, රූඩ් 2, පර්. 37.78)ක් වූ පහලවෙලගොඩ දෙනිය කුඹුර නමැති ඉඩම.**

උතුරට : ඇළ ;
නැගෙනහිරට : සැලැස්මේ කැබලි අංක 1 ;
දකුණට : ඇළ ;
බටහිරට : සැලැස්මේ කැබලි අංක 3.

**කැබලි අංක 3 - විශාලත්වයෙන් හෙක්ටයාර් 0.754 (අක්කර 1, රූඩ් 3, පර්. 18.02)ක් වූ පහලවෙලගොඩ දෙනිය කුඹුර නමැති ඉඩම.**

උතුරට : ඇළ ;
නැගෙනහිරට : සැලැස්මේ කැබලි අංක 2 ;
දකුණට : ඇළ ;
බටහිරට : සැලැස්මේ කැබලි අංක 4.

**කැබලි අංක 4 - විශාලත්වයෙන් හෙක්ටයාර් 0.302 (අක්කර 0, රූඩ් 2, පර්. 39.37)ක් වූ මල්ගහමුල කුඹුර නමැති ඉඩම.**

උතුරට : ඇළ ;
නැගෙනහිරට : සැලැස්මේ කැබලි අංක 3 ;
දකුණට : ඇළ ;
බටහිරට : සැලැස්මේ කැබලි අංක 5.

**කැබලි අංක 5 - විශාලත්වයෙන් හෙක්ටයාර් 0.506 (අක්කර 1, රූඩ් 1, පර්. 0.00)ක් වූ ගල්ලෙනලඟ කුඹුර නමැති ඉඩම.**

උතුරට : ප්‍රාදේශීය සභා පාර සහ ඇල ;
නැගෙනහිරට : සැලැස්මේ කැබලි අංක 4 ;
දකුණට : ඇළ ;
බටහිරට : ප්‍රාදේශීය සභා පාර සහ ඇල

11-470

---

## 1980 අංක 2 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනත

### 2 වැනි වගන්තිය යටතේ නියමය

1980 අංක 02 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනතේ, 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, ජනාධිපති, මහින්ද රාජපක්ෂ වන මම, මෙහි පහත සඳහන් උපලේඛනයේ විස්තර කොට ඇති ඉඩම් කොටස "කෑගල්ල නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ නාගරික උද්‍යානය ඉදිකිරීම සඳහා වහා අවශ්‍යව ඇති බව මාගේ මතය වන හෙයින්, එකී ඉඩම අදාළ කාර්යය සඳහා අවශය බව මෙම නියමයෙන් ප්‍රකාශයට පත් කරමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2013 ඔක්තෝබර් මස 24 වැනි දින,
කොළඹ,
ජනාධිපති කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ කොට්ඨාශ අංක 9 ගොලහැල ගමේ පිහිටියා වූ ද, බලයලත් මිනින්දෝරු පී. එම්. සුනිල් මහතා විසින් 2013.07.29 වැනි දින මැන පිළියෙල කරන ලද පිඹුරු අංක 2289හි කැබලි අංක 1 සිට 5 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් අක්. 7, රූඩ් 0, පර්. 18.95ක් පමණ විශාල වූ ඉඩම් කොටස් වලට මායිම් පහත පරිදි වේ.

**කැබලි අංක 1 - විශාලත්වයෙන් අක්කර 0, රූඩ් 1, පර්. 03.80ක් පමණ වූ රදාගොල හැලදෙණියේ කුඹුර නමැති ඉඩම.**

උතුරට : බණ්ඩාරනායක මාවතේ වරිපනම් අංක 280 දරන ඉඩම ;
නැගෙනහිරට : බණ්ඩාරනායක මාවතේ වරිපනම් අංක 280 දරන ඉඩම ;
දකුණට : ඇළ ;
බටහිරට : කැබලි අංක 2.

**කැබලි අංක 2 - විශාලත්වයෙන් අක්කර 0, රූඩ් 3, පර්. 15.25ක් පමණ වූ රදාගොලහැලදෙණියේ කුඹුර නමැති ඉඩම.**

උතුරට : කැබලි අංක 3 සහ බ. මී. ටී. එන්. කාදර්ගේ අංක 833 දරන පිඹුර ;
නැගෙනහිරට : බණ්ඩාරනායක මාවතේ වරිපනම් අංක 280 දරන ඉඩම සහ කැබලි අංක 1 ;
දකුණට : බණ්ඩාරනායක මාවතේ වරිපනම් අංක 288 දරන ඉඩම සහ බණ්ඩාරනායක මාවත ;
බටහිරට : කැබලි අංක 3.

**කැබලි අංක 3 - විශාලත්වයෙන් අක්කර 0, රූඩ් 0, පර්. 15.20ක් පමණ වූ පුද්ගලික පාර.**

උතුරට : කැබලි අංක 4 ;
නැගෙනහිරට : බ. මී. ටී. එන්. කාදර්ගේ අංක 833 දරන පිඹුර සහ කැබලි අංක 2 ;
දකුණට : කැබලි අංක 2 සහ බණ්ඩාරනායක මාවත ;
බටහිරට : කැබලි අංක 4.

**කැබලි අංක 4 - විශාලත්වයෙන් අක්කර 3, රූඩ් 3, පර්. 36.10ක් පමණ වූ රදාගොලහැල හා ගලහිටියාවකුඹුර නමැති ඉඩම.**

උතුරට : බ. මී. සී. කුරුකුලසූරියගේ අංක 762/A දරන පිඹුර, ඇළ සහ කේ. පී. ජයසේන හා තවත් අයගේ ඉඩම ;
නැගෙනහිරට : බ. මී. ටී. එන්. කාදර්ගේ අංක 833 දරන පිඹුර සහ කැබලි අංක 3 ;
දකුණට : රජයට අයත් ඉඩම සහ කැබලි අංක 2 ;
බටහිරට : වින්සන්ට් වික්‍රමසිංහ මාවත, බ. මී. සී. කුරුකුලසූරියගේ අංක 762/A දරන පිඹුර, ඇළ සහ කේ. පී. ජයසේන හා තවත් අයට අයත් ඉඩම.

**කැබලි අංක 5 - විශාලත්වයෙන් අක්කර 1, රූඩ් 3, පර්. 28.60ක් පමණ වූ රදාගොලහැල හා ගලහිටියාව කුඹුර නමැති ඉඩම.**

උතුරට : වික්‍රමසිංහ පටුමඟ සහ බමි/සී. කුරුකුලසූරියගේ අංක 762/A දරන පිඹුර ;
නැගෙනහිරට : වින්සන්ට් වික්‍රමසිංහ මාවත ;
දකුණට : රජයට අයත් ඉඩම සහ බණ්ඩාරනායක මාවත ;
බටහිරට : බණ්ඩාරනායක මාවත සහ කැ 96 වැනි මූලික පිඹුරට අයත් ඉඩම.

11-471

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.